**ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපි වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම**

---

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | චක්‍රලේඛයේ 7 (VI) ඡේදය ප්‍රකාරව අක් මුදල් ගැලපිම් ගිණුමක් පිළියෙල කල යුතු වුවත් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ලෙස දැක්වෙන රු.4,101,659,023 ක වටිනාකම ශුන්‍ය කර පෙන්වීම සඳහා ගැලපුම් ගිණුමක් සකස් කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අග්‍රිම සැසඳුම් ප්‍රකාශය සකස් කර මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කල යුතු වීම. | අග්‍රිම ගැලපුම් ගිණුම සකස් කර ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව. |
| (ආ) | චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති ඒ සී ඒ 06 ආකෘතිය ප්‍රකාර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව එක් එක් ස්ථාවර වත්කම් වර්ගීකරණය කර එම වර්ගීකරණ කේතයන් යටතේ වත්කම් වටිනාකම වෙන වෙනම දක්වා උප එකතුව දැක්විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එලෙස දක්වා නොතිබුණි. | චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති ආකෘතිය ප්‍රකාරව වත්කම් වටිනාකම දැක්විය යුතු වීම. | ඉදිරියේ දී වත්කම් පිළිබඳ ප්‍රකාශය සකස් කිරීමේදී එක් එක් ස්ථාවර වත්කම් වර්ගීකරණය කර එම වර්ගීකරණය යටතේ වත්කම් වටිනාකම් වෙන වෙනම දැක්වීමට කටයුතු කරන බව. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අදායම් නොවන ලැබීම් රු.11,589,235 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | ඉදිරියේදී අදාල නිලධාරීන්ට ඒ පිළිබඳව මනා පුහුණුවක් ලබා දීමටත් එහි සඳහන් අඩුපාඩු නිවැරදි කිරීමටත් අවශ්‍ය කටයුතු කරන බව. |

1.6.3

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට දෙපාර්තමේන්තුවේ වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළව ශේෂ පත්‍රයේ පුස්තකාල පොත් වටිනාකම රු.475,383 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි වත්කමක් දක්වා නොතිබුණි. | වත්කම් නිවැරදිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනාවරණය කල යුතු බව. | මූල්‍ය ප්‍රකාශනවල පුස්තකාල පොත් වටිනාකම ඇතුළත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. |

**1.6.4** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබූ විෂයයන් 02 කට අදාල වටිනාකම් ,ඒවායේ තථ්‍ය අගයන් සමඟ සැසඳීමේදි රු.376,940,361 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම මුදල් ගලායාම් යටතේ දක්වා තිබුණු විෂයයන් 03 කට අදාළ වටිනාකම ඒවායේ තත්‍ය අගයන් සමඟ සැසඳීමේදි රු.4,216,227,206 ක වෙනසක් නිරීක්ෂණය විය.මෙම වෙනස්කම් සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. තවද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු විෂයයන් 02 ක මුදල් ගලා ඒම් හා විෂයයන් 03 ක මුදල් ගලා යාම්වල එලෙස පැවති වෙනස්කම් පිළිවෙලින් රු.4,375,340,567 ක් හා රු.4,222,858,200 ක් විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | ඉදිරියේ දී අදාල නිලධාරීන්ට ඒ පිළිබඳව මනා පුහුණුවක් ලබා දීමටත් එහි සඳහන් අඩුපාඩු නිවැරදි කිරීමටත් අවශ්‍ය කටයුතු කරන බව. |

**1.6.5** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැඩ තහනමට ලක් වූ නිලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.9500 ක් වූ වසර 2 ක් ඉක්ම වූ ණය ශේෂය සහ රු.55,318 ක් වූ වසර 5 ඉක්ම වූ ණය ශේෂය අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. | ගබඩා කම්කරු ඊ.ඒ. සුදත් ජයලාල් මහතා නැවත සේවයේ පිහිටුවා ඇති බැවින් ඉදිරියේදී ඔහුගේ වැටුපෙන් අදාළ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කරන බව හා අදාළ නඩු තීන්දුව ලබා දුන් පසු ගබඩා කම්කරු වයි.අයි උඩගේ මහතාගෙන් අයවිය යුතු රු.9,500 ක ණය ශේෂය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ සේවය හැර ගිය නිලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.534,412 ක ශේෂයක් පැවති අතර ඉන් වසර 04 සිට 05 දක්වා කාලය ඉක්ම වූ රු.69,725 ක ශේෂයක් ද වසර 05 ඉක්ම වූ රු.390,167 ක ශේෂයක් ද විය. | ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය | නීතිපතිගේ ලිපි අංක සී/98/2018 හා 2018.06.21 දිනැති ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් අනුව ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව. |

## 1.6.6 වාණිජ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොත් තොග අපහරණයෙන් වූ රු.54,771,558 ක අලාභය ලාභ අලාභ ගිණුමේ රු.83,680,906 ක් ලෙස රු.28,909,348 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් කටයුතු සිදු කළ යුතු වීම. | 2018 දෙසැම්බර් 31 දිනට භාවිතයෙන් ඉවත් කළ පොත් තොගවල වටිනාකම වන රු.83,680,906 ක මුදලට සමාන වටිනාකමක් ලාභයෙන් වෙන්කිරීම ලාභාලාභ ගිණුමමේ සටහන් කර ඇති බව. |
| (ආ) | කල්පිත ගාස්තු ඇතුලත් සටහන් ගිණුමේ කල්පිත ගාස්තු අඩු කල පසු ශුද්ධ අලාභය දැක්වීමේදී අත්තිකාරම් ගිණුම් හර ශේෂ සඳහා පොලිය වූ රු.6,849,330,109 ක ශේෂය සැලකිල්ලට ගෙන නොතිබුණි. | අත්තිකාරම් ගිණුම් හර ශේෂ සඳහා වූ පොලිය ගැලපිය යුතු වීම. | ඉදිරියේ දී පොළිය ගැලපීමට අවශ්‍ය කටයුතු කරන බව. |
| (ඇ) | 2018 අගෝස්තු මස වියදම් වාර්තා අනුව රු.1,681,213 ක පොත් බෙදා හැරීම් දීමනා (විදුහල්පති) සංග්‍රහ වියදම් ලෙසත් රු.2,220 ක සංග්‍රහ වියදම් පොත් බෙදා හැරීම් දීමනා වියදම් ලෙසත් ලෙජර් ගිණුම්වල මාරු සටහන් මගින් ගලපා තිබුණි. | නිවැරදි වර්ගීකරණයන් යටතේ ගිණුම් ගත කළ යුතු වීම. | අතපසුවීමකින් ගිණුම් දෙකෙහි මුදල මාරු වී සටහන් වී ඇත. මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගන්නා බව. |
| (ඈ) | දෙපාර්තමේන්තුව සතුව රු.48,962,000 ක් වටිනා වාහන 14 ක් පැවතිය ද රු.11,237,810 ක වටිනාකම වූ ලොරි රථ 02 ක් පමණක් ශේෂ පත්‍රයේ වාහන ලෙස දක්වා තිබීම හේතුවෙන් වාහන වටිනාකම රු.37,724,190 කින් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියලු වත්කම් මූල්‍ය ප්‍රකාශය තුළ අනාවරනය කළ යුතු වීම. | වාහනවල වටිනාකම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. |
| (ඉ) | 2018 වර්ෂයේ මුද්‍රණ කරුවන් වෙත ගෙවීම් කරන ලද ලේඛනයේ නිරවුල් නොකරන ලද රු.1,147,200 ක ණයහිමි ශේෂ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල දක්වා නොතිබුණි. | මෙම ශේෂ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කල යුතු වීම. | ජ`නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. |
| (ඊ) | පෞද්ගලික සමාගමක් වෙතින් 2009 වර්ෂයේ සිට ලැබිය යුතුව පැවති රු.7,431,012 ක ශේෂය සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙම ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම මුදල ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2018 වර්ෂයේ මුද්‍රණ ඇනවුම් ලබා දුන් ගිවිසුම් ගත මුදල රු.15,059,725 ක් වූ පෙළ පොත්,ගුරුමාර්ගෝපදේශ සහ අතිරේක පොත් වර්ග 37 ක් ගිණුම් වර්ෂය අවසන් වන විටත් මුද්‍රණය කර භාර දී නොතිබුණි. | විධිමත් පරිදි නියමිත දින වකවානු තුල මුද්‍රණය කරවා ගත යුතු බව. | මීට අදාළ විස්තර ඇමුණුම් මගින් දක්වා ඇති බව. |
| (ඌ) | 2018 දෙසැම්බර් 31 දිනට ණය හිමි ශේෂය තුළ ඇතුළත් 2018 වර්ෂයට පෙර වර්ෂ වල ණය හිමියන්ට අදාළ වටිනාකම රු.2,887,230 ක් වූ ගුරු මාර්ගෝපදේශ, අතිරේක පොත් සහ පෙළ පොත් 2019 අප්‍රේල් 30 දින වන විටත් මුද්‍රණය කර භාර දී නොතිබුණි. | විධිමත් පරිදි නියමිත දින වකවානු තුල මුද්‍රණය කරවා ගත යුතු බව. | මීට අදාළ විස්තර ඇමුණුම් මගින් දක්වා ඇති බව. |

## 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | ගිණුම් 02 කට අදාලව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්මවූ රු.1,031,658 ක් වටිනා චෙක්පත් 123 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී අදාළ සිහිකැඳවීම් සිදුකර මු.රෙ.396 (ඇ) අනුව කටයුතු කරන බව. |
| | (ii)මුදල් රෙගුලාසි | වාහන භාර නිලධාරීන් විසින් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු | ඉදිරියේ දී මෝටර් වාහන පිළිබඳ ලැයිස්තුවක් සකස් |

| | | | | |
|---|---|---|---|---|
| | 1647 (ආ) සහ (ඉ) | තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳ ලැයිස්තුවක් තබාගත යුතු අතර වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. | කළ යුතු වීම. | කිරීමට පියවර ගන්නා බව. |
| (ආ) | ආයතන සංග්‍රහයේ III වැනි පරිච්ඡේදය සහ 2009 පෙබරවාරි 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 1589/30 අංක දරන අති විශේෂ ගැසට් නිවේදනයෙන් පලකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ xviii පරිච්ඡේදය | රාජ්‍ය සේවයේ එකම ස්ථානයක දීර්ඝ සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් වන නමුත් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් 18 ක් සහ අනෙකුත් සේවාවල නිලධාරින් 15 ක් අවුරුදු 05 සිට 22 දක්වා කාල පරාසයක් අඛණ්ඩව දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව තිබුණි. | ආයතන සංග්‍රහය සහ අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරුන් බඳවා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණයකදී ඉහළම අධ්‍යාපන සුදුසුකම් සපුරාලීම මෙම දෙපාර්තමේන්තුවට බඳවා ගැනීමේදී මූලිකව සලකා බලන බව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම් සුවිශේෂීව සලකා බලා කාර්යය පටිපාටියට අනුව නිලධාරීන් ස්ථාන ගත කරනු ලබන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගැනීම හා නිශ්චිත සැලැස්මක් අනුව කටයුතු නොකිරීම නිසා වැය විෂයයන් 05 කට අදාලව සියයට 18 සිට සියයට 21 දක්වා පරාසයක රු.මිලියන 6.61 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලසුමකින් හා කළමණාකාරිත්වයකින් යුතුව ඇස්තමේන්තු සකස් කිරිමට පියවර ගත යුතු බව | (i) 2-1-1003 වැය විෂය ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වූයේ නිදහස් කළ නිලධරින් වෙනුවට අනුප්‍රාප්තිකයන් නොපැමිණිම බව.<br>(ii) 2-1-1402 සහ 2-1-1409 වැය විෂයන්ගේ වියදම් කළමනාකරණය කර ගැනීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව.<br>(iii) 2-1-2401 වැය විෂයේ ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වූයේ දෙසැම්බර් මස තුළදී කිරීමට සැලසුම් කළ පුහුණු වැඩ සටහන් ඒ අයුරින් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම බව.<br>(iv) 2-1-2104 වැය විෂයේ ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වූයේ ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේ ගැටළුව නිසා බව. |

### 2.2 වත්කම් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තු පරීක්ෂණාගාරය සතුව ඇති වටිනාකම විගණනයට ඉදිරිපත් නොවූ පරීක්ෂණ උපකරණ වර්ග 04 ක් පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනිමකින් තොරව ඌන උපයෝජිතව | උපකරණ ඵලදායීව උපයෝජනය කළ යුතු බව. | ITI ආයතනයෙන් පුහුණු නිලධාරියෙකු ගෙන්වා ගෙන අදාළ යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර |

| | | |
|---|---|---|
| පැවතුණි . | | ඒවා ක්‍රියාකරන ආකාරය අධ්‍යනය කර ඉදිරි වර්ෂවල ගුණාත්මක තත්ත්ව පරීක්ෂාවේ දී භාවිත කිරීමට අපේක්ෂිත බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදනයන්**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් මාසයේදී දෙපාර්මේන්තුව විසින් කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන1.58 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (II) වගන්තිය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබන පිරිවිතර සියළුම ලංසුකරුවන් අතර සමාන මට්ටමේ තරගකාරිත්වයක් ඇති වන පරිදි පොදු ලක්ෂණ වලින් යුක්ත විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබුණු පිරිවිතර වල දිග, පළල , උස, ඝණකම, අමු ද්‍රව්‍ය (ලෑලිවල හෝ තහඩු වල වර්ගය) , රූප සටහන් ආදී විස්තර දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී මිල ගණන් කැඳවීමේ දී රූප සටහන් සහිතව තාක්ෂණික ඇගයීම් කමිටු පිරිවිතර ලබා ගැනීමට උපදෙස් ලබා දුන් බව. |
| (ii) මෙම ප්‍රසම්පාදනය සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන කාල රාමුවක් සකස් කර නොතිබුණි. මිල ගණන් විවෘත කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලබා ගැනීම, ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීම, ආයතන වලට ඇනවුම් ලිපි යැවීම, උපකරණ ලබා ගැනීම හා ගෙවීම් කිරීම යන සියළුම කාර්යයන් දින 02 ක් තුළ සිදු කර තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රසම්පාදන කාල රාමුවක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු වීම. | නව පරිශ්‍රයකට යාමේ අරමුණ ඇතිව මෙම භාණ්ඩ මිලදී ගැනීම් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කළ යුතුව පැවති බැවින් ද ප්‍රසම්පාදන කාර්යයන් ඉතා කෙටි කාලයකින් සිදු කිරීමට සිදු වූ බැවින් ද එසේ සිදුකල අතර ඉදිරි මිලදී ගැනීම් ප්‍රසම්පාදන කාල රාමුවක් සකස් කර විධිමත් ආකාරයට කළ යුතු බවට |

| | | |
|---|---|---|
| | | අදාළ නිලධාරීන් දැනුවත් කළ බව. |
| (iii) අයිතම 05 ක් වෙනුවෙන් අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනයන්හි මිලගණන් පිරිවිතරය සමග නොගැලපෙන බව දක්වමින් ප්‍රතික්ෂේප කර තිබුණද මිල ගණන් කැඳවීමේදී පිරිවිතරයන් නිශ්චිතව සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | භාණ්ඩ මිලදී ගැනීමේ දී නිශ්චිත පිරිවිතර ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් වෙළඳ පොළෙහි ඇති මෙම භාණ්ඩ අලෙවි කරනු ලබන ආයතන වෙතින් විවිධ ප්‍රමාණයෙන් හා ගුණාත්මක භාවයෙන් යුක්තව මෙම අයිතම අලෙවි කරනු ලබන බැවින් අදාළ ආදර්ශ සපයාගෙන පරීක්ෂා කළ බව සහ එහි දී භාණ්ඩයේ මිල පමණක් නොව ගුණාත්මක කල් පැවැත්ම ආදි කරුණු සැලකිල්ලට භාජනය කර සුදුසු අයිතමයන් තෝරා මිලදී ගැනීම සිදු කළ බව. |
| (ආ) **<u>පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීමේ ප්‍රසම්පාදන 2018/2019</u>**<br>2018 වර්ෂයට අවශ්‍යකරන පෙළ පොත් වර්ග 357 ක් සඳහා පිටපත් 27,598,600 ක් සහ පිටපත් 39,714,000 ක් රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙතින් මුද්‍රණය කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් කරන ලද සෝදිසි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ලංසු කැඳවීමේ කොන්දේසි පත්‍රිකාවේ 13.3 ජේදයට අනුව අනුයාත වර්ෂ 03 ක විගණිත ගිණුම් ඉදිරිපත් කළ යුතු බව සඳහන් වී තිබුණ ද තෝරා ගෙන තිබුණු ආයතන 06 ක් එම අවශ්‍යතාවය අනුව කටයුතු කර නොතිබුණි | ලංසු කැඳවීමේ කොන්දේසි අනුව කටයුතු කළ යුතු වීම. | ලංසු කැඳවීමේදී කොන්දේසි පත්‍රිකාව අනුව තාක්ෂණ ඇගයීම් කමිටුව මුද්‍රණාල වල ගිණුම් පිළිබඳව නිරීක්ෂණය කරනු ලබන බව සහ එක් එක් මුද්‍රණාල විසින් ඉදිරිපත් කළ සටහන් පත් විශ්ලේෂණය සහ මුද්‍රණාල අධීක්ෂණ තොරතුරු පත් අවධානයට යොමු කරන බව. |
| (ii) ඉහල ගුණත්වයකින් යුතුව පෙළ පොත් මුද්‍රණය කර ගැනීමේදී මුද්‍රණකරුවන් ඇගයිම සඳහා නිර්ණායක 04 ක් සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රතිශත නිශ්චය කර තිබුණි. ලංසු කරුවන් තරහකාරී මිල ගණන් ඉදිරිපත් කල අවස්ථාවලදී මුද්‍රණ සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා | ප්‍රසම්පාදන කොන්දේසි අනුව කටයුතු කළ යුතු වීම. | ලංසු කරුවන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සලකා බැලීමේදී වැඩි අගයක් ගන්නා බව ප්‍රසම්පාදන කමිටුව විසින් අවධානයට ලක් කර සාකච්ඡා කිරීමෙන් පසුව රජයට වාසි සහගත සාධාරණ මිල තත්ත්වයකට |

| | | |
|---|---|---|
| අනුගමනය කරන ක්‍රමවේදයන් පිළිබඳව ප්‍රසම්පාදන කොන්දේසි වල ඇතුළත් කර නොතිබුණි. | | සංශෝධනය සිදු කිරීමට ක්‍රමවේදයන් අනුගමනය කරන ලද බව. |
| (iii) 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී රාජ්‍ය ආයතන වලට මුද්‍රණය සඳහා ලබා දී ඇති පෙළ පොත් ප්‍රමාණය සියයට 14 කින් අඩු වී තිබුණි. | රාජ්‍ය ආයතනවල පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පරිදි රාජ්‍ය ආයතනවලට ද පොත් යම් ප්‍රමාණයක් මුද්‍රණය සඳහා අවස්ථාව ලබාදීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් යෙදිය යුතු බව | 2017 සහ 2018 වර්ෂ වලදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුවට සහ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවට විවෘත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පරිබාහිරව පොත් මුද්‍රණය සඳහා පවරන ලද බව. |
| (iv) 2018 වර්ෂයේ නව නිර්දේශ යටතේ මුද්‍රණය කරනු ලබන පෙළ පොත් 56 ක පිටපත් ප්‍රමාණය 9,417,000 ක් වුවද එම කිසිදු මුද්‍රණයක් රාජ්‍ය අංශය වෙත ලබා දී නොතිබුණි. | -එම- | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව තුළ ඇති යන්ත්‍ර ධාරිතාවයන්ට සරිලන පරිදි එම ආයතනයට මුද්‍රණය කිරීමට හැකි පෙළ පොත් පමණක් තෝරා ගැනීමට අවස්ථාව ලබා දුන් බව. |
| (v) 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 3,499.25 ක් වටිනා පොත් 419 ක පිටපත් 39,714,000 ක් රාජ්‍ය ආයතන 02 කින් හා පෞද්ගලික මුද්‍රණකරුවන් 27 දෙනෙකුගෙන් මුද්‍රණය කරවා ගෙන තිබුණි. මෙහිදී කොමසාරිස්වරයෙකු හා නියෝජ්‍ය කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් නම් කර එම කමිටු නිර්දේශ මත අවස්ථා කිහිපයක දී මුද්‍රණකරුවන් හට පෙළ පොත් මුද්‍රණය සඳහා වගකීම් පවරා දී තිබුණා ද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අවසරයක් ලබා ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සහිතව තීරණ ගැනීමට කටයුතු කළ යුතු වීම. | පාසල් පෙළ පොත් ලබා දීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සැලසුම් කිරීමේදී සමස්ත සිසු පරපුර වෙත සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය වලින් අදාළ පෙළ පොත් නොපමාව සම්පාදනය කර බෙදාහැරීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරය වන බව සහ මුද්‍රණ ආයතන යම් ගැටළුවකට මුහුණ දී ඇණවුම් ලද පෙළ පොත් මුද්‍රණය නොකරන අවස්ථාවක දී ගිවිසුමේ 20 වගන්තිය ප්‍රකාරව කටයුතු කරන බව. |
| (vi) මෙම කමිටුව මගින් ලංසු ප්‍රදානය කරන ලද ආයතන 02 ක් විසින් ලංසු ප්‍රදානය කර මාස 03 කට පසුව පොත් 05 ක පිටපත් 586 ක් මුද්‍රණය කිරීම | ඉදිරියේදී මුද්‍රණ කටයුතු පැවරීමේදී මෙවැනි මුද්‍රණ ආයතන පිළිබඳව ගැඹුරින් සොයා බලා | නීතිරීති රෙගුලාසි වලට අනුව ලිපි හුවමාරු කර ගැනීමට සිදු වු නමුත් ප්‍රමාද නොවී මෙම පොත් මුද්‍රණය |

| | | |
|---|---|---|
| ප්‍රතික්ෂේප කර තිබූ නිසා වෙනත් මුද්‍රණ ආයතන 04 ක් මගින් නැවත මුද්‍රණය කර තිබුණි. මුද්‍රණ ඇනවුමෙහි ලංසු සුරක්ෂණ රජයට පවරා ගෙන තිබුණද මෙලෙස ඇනවුම් ප්‍රතික්ෂේප කිරීම තුළින් පාසල් දරුවන් වෙත පෙළ පොත් නියමිත කාලයට ලබා දීමට නොහැකි වී තිබුණි. | තීරණ ගත යුතු වීම. | කර ගැනීමට කටයුතු කරන ලද බව. |
| (vii) 2017 ඔක්තෝබර් 25 දිනැති මෙහෙයුම් කමිටු වාර්තාවට අනුව දෙපාර්තමේන්තු පාර්ශවයෙන් සිදු වී ඇති ප්‍රමාදය දින 50 කට වඩා වැඩි වූ අවස්ථාවල අදාළ විෂයභාර නිලධාරීන්ගෙන් ප්‍රමාදයට හේතු වූ කරුණු පිළිබඳව වාර්තා ලබා ගැනීම සිදු කල යුතු වුවද , එලෙස කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගෙන් ප්‍රමාදයට හේතු වූ කරුණු පිළිබඳව වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ වන විට මෙම පොත් පිළිබඳව අදාළ කරුණු ඇතුළත් වාර්තාවක් ලබාගෙන ඇති බවත් ඉදිරියේ දී අප්‍රමාදව මෙම නිලධාරීන්ගේ වාර්තා ලබා ගැනීමට බලාපොරොත්තු වන බව. |
| (viii)දෙපාර්තමේන්තු මෙහෙයුම් කමිටු වාර්තාව අනුව පෙළ පොත් ලබා දීමේ දී සිදුකල ප්‍රමාදයන් වෙනුවෙන් දින 9 සිට 55 දක්වා මුද්‍රණාල ප්‍රමාදය සිදු වී තිබුණු අතර ඇතැම් අවස්ථාවල දී මුද්‍රණාල ප්‍රමාදයට වඩා වැඩිපුර දින ගණන් එනම් දින 14 සිට 97 ක් දක්වා දෙපාර්තමේන්තු ප්‍රමාදය ලෙස සලකා දඩ මුදල් අය කිරීමෙන් නිදහස් කර තිබුණි. | දඩ මුදල් අයකිරීම විධිමත් ආකාරයට කළ යුතු වීම. | දෙපාර්තමේන්තු මෙහෙයුම් කමිටු වාර්තා වල සඳහන් කර තිබූ ප්‍රමාද වී පොත් ලබා දී ඇති මුද්‍රණාල වල දෙපාර්තමේන්තු ප්‍රමාදයන්ට අදාල විස්තර දක්වා ඇති බව. |

## 3.2 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i)පෙළ පොත් බෙදාහැරීම සම්බන්ධයෙන් අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ 2017 මැයි 31 දිනැති අංක 2017/09 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 9 ඡේදයට අනුව ගබඩාවල අතිරික්ත පොත් ගබඩා කර තබා ගැනීමක් සිදු නොවන ලෙස අත්‍යවශ්‍ය පෙළ පොත් පමණක් නිවැරදිව ගණනය කර ඉල්ලුම් කිරීමට පාසල් වෙත උපදෙස් දී තිබුණි. එහෙත් කොළඹ ප්‍රදේශයේ පාසැල් 11 කට අවශ්‍යතාවය ඉක්මවා පෙළ පොත් 10,540 ක් | පෙළ පොත් අවශ්‍යතාවය නිවැරදිව තීරණය කර උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව පෙළ පොත් සැපයීම. | පාසැල් විසින් ඇණවුම් ලේඛන සහ අමතර ලිපි මඟින් පෙළ පොත් ඉල්ලුම් කරන බව සමහර අවස්ථා වලදී යම් යම් ප්‍රමාද දෝෂයන් සිදු වන බව , හා ඉදිරියේ දී මෙවැනි ගැටළු වළක්වා ගනිමින් විධිමත් ලෙස කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරගෙන යනු ලබන බව. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් වැඩිපුර ලබා දී තිබුණි. | | |
| (ii) | පාසලේ අවශ්‍යතාවය අනුව පෙළපොත් නිවැරදි ප්‍රමාණයන්ගෙන් ඇණවුම් නොකිරීම හේතුවෙන් 2018 වර්ෂය වෙනුවෙන් අවශ්‍ය කරන පෙළ පොත් සිසුන් අතට පත් කර මාස 06 ක් ඉක්ම ගොස් තිබුණ ද කොළඹ ප්‍රදේශයේ පාසැල් 08 ක පෙළ පොත් 13,194 ක් භාවිතයට නොගෙන ගබඩා කර තිබුණි. | පෙළ පොත් අවශ්‍යතාවය නිවැරදිව තීරණය කර සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම. | සමහර අවස්ථාවලදී යම් යම් ප්‍රමාද දෝෂයන් සිදු වන බව හා ඉදිරියේ දී මෙවැනි ගැටළු වළක්වා ගනිමින් විධිමත් ලෙස කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරගෙන යනු ලබන බව. |
| (ආ) | <u>**පෙළ පොත් සඳහා වූ තත්ත්ව පරීක්ෂණයන්**</u><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | 2019 වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂයේදී මුද්‍රණය කරන ලද පොත් වල පිට කවර හා ඇතුලත කඩදාසි වල දෙපාර්තමේන්තුව නියම කර ඇති පිරිවිතරවලට අනුව මුද්‍රණ හා ගබඩා අනුමැතීන් ලබා දීමේ දී පරීක්ෂා කළ යුතු ඇදෙන සුළු බව (Tensile index)පරීක්ෂාව කිසිදු පොතක් සම්බන්ධයෙන් හෝ සිදු කර නොතිබුණි. | විධිමත්ව තත්ව පරීක්ෂණ කටයුතු සිදු කළ යුතු වීම. | කඩදාසි වල Tensile Index පරීක්ෂාව සිදු කරනු ලබන්නේ ඒවා මුද්‍රණයට පෙරය. මුද්‍රණය සඳහා යන්ත්‍රවලට දැමූ පසු හා අකුරු මුද්‍රණය කළ පසු කඩදාසි වල තත්ත්වය වෙනස් වේ.එබැවින් මුද්‍රණය සඳහා ගන්නා කඩදාසි වල ඩම් පරීක්ෂාවේ දී මෙම ගුණාංගය පරීක්ෂා කරනු ලබන බව. |
| (ii) | 2018 ජුලි 01 සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා මුද්‍රණ සැපයුම්කරුවන් මගින් මුද්‍රණය කරනු ලබන පොත් වල මුද්‍රණ හා ගබඩා අනුමැතිය ලබා දිමේදී ප්‍රමාණවත් සාම්පල් සංඛ්‍යාවක් පරීක්ෂා කර නොතිබුණි. | ප්‍රමාණවත් සාම්පල් සංඛ්‍යාවක් පරීක්ෂා කළ යුතු වීම. | පෙළ පොත් තොග මුද්‍රණයට පෙර පෙරටු පිටපත් දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන අංශයට ලබා දෙන අතර එම පිටපත් වලින් එක් සාම්පලයක් පරීක්ෂාවට ලක් කරනු ලබන බව. |
| (iii) | 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.3 වගන්තිය අනුව ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය විසින් සකස් කරනු ලබන ප්‍රමිතීන් හැකි උපරිම ප්‍රමාණයෙන් භාවිතා කල යුතු වුවද තත්ව පරීක්ෂණ පිරිවිතරයන් 04 කට අදාළව තත්ව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතු බව. | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ඉදිරිපත් කර ඇති ප්‍රමිති ISO ප්‍රමිතීන්ට අනුකූලවන අතර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවටම අදාළ යන්ත්‍ර ලබා ගැනීමේදී ISO ප්‍රමිතීන්ට |

| | | |
|---|---|---|
| පරීක්ෂණ හා පරීක්ෂණ ක්‍රමයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | | අනුකූලව යන්ත්‍ර ලබා ගෙන ඇති බව. |
| (iv) 2010 වර්ෂයේ රු.මිලියන 3.35 කට මිල දී ගෙන ඇති Techni dyne Color Spectrophotometer උපකරණය දෙපාර්තමේන්තු විද්‍යාගාරයේදී දිප්තතාවය සහ පරාන්ධතාවය මැනීමට භාවිතා කර තිබුණි. 2018 අප්‍රේල් 04 දින සිට මෙම යන්ත්‍රය නිසි පරිදි සේවා නොකිරීම හේතුවෙන් 2019 වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂයේදී මුද්‍රණය කරන ලද කිසිදු පෙළ පොතක පාරාන්ධතාවය සහ දීප්තතාවය යන පිරිවිතරයන් පරීක්ෂාවට ලක් කර නොතිබුණි. | කඩිනමින් යන්ත්‍රය අළුත් වැඩියා කර විධිමත්ව තත්ව පරීක්ෂණ කටයුතු සිදු කළ යුතු බව. | Brightness හා Opacity මැනීමට භාවිතා කරන යන්ත්‍රය දැනට ක්‍රියාවිරහිතව පවතින අතර , එය අලුත් වැඩියාව පිළිබඳ ගැටලු පැන නැගී ඇති බවත් ඒ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතින බව. |
| (ඇ) **<u>නව විෂය නිර්දේශය අනුව සකස් කල 3 ශ්‍රේණියේ ඉංග්‍රීසි විෂයයට අදාල පොත්</u>**<br>2018 වර්ෂයේදී බෙදාහැරීම සඳහා නව විෂය නිර්දේශය අනුව සකස් කල 3 ශ්‍රේණිය ඉංග්‍රීසි වැඩ පොත , ඉංග්‍රීසි ලිවීම් පොත සහ ඉංග්‍රීසි පෙළ පොත දෝෂසහිත වීම නිසා 2019 වර්ෂයේදී නැවත වරක් සංශෝධනය කිරීමට සිදුව තිබුණි. ඒ හේතුවෙන් 2018 වර්ෂයේ අවශ්‍යතාවයට වඩා වැඩිපුර මුද්‍රණය කල රු.මිලියන 5.72 ක් වටිනා පොත් 27,275 ක් සිසුන්ගේ භාවිතයට ගැනීමෙන් තොරව ඉවත් කර තිබුණි. | නිවැරදිව පෙළ පොත් සකස් කිරීම තුළින් රාජ්‍ය මුදල් අපතේ යාම වලක්වා ගත යුතු වීම.<br>විෂය නිර්දේශයේ පැවති දෝෂ සහගත තත්ත්වයන් පොත් සකස් කරන අවස්ථාවේ හඳුනා ගැනීමට කටයුතු කල යුතු වීම. | 2017 වර්ෂයේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් හඳුන්වා දුන් අකුරු කිහිපයක හැඩතල 2018 වර්ෂයේදී සංශෝධනය කරන ලද බැවින් 03 වන ශ්‍රේණියේ ඉංග්‍රීසි විෂයයට අදාළ පොත් නැවත සංස්කරණය කිරීමේ අවශ්‍යතාවය මතු වූ බව සහ මුල් අවස්ථාවේ මුද්‍රණය කළ පෙළ පොත් පාසල් වලට බෙදීම පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් මතු වූ බැවින් එම පෙළ පොත් ගබඩාවේ ඉතිරි වූ බව. |
| (ඇ) **<u>වාර්ෂික පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කිරීම</u>**<br>2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මුද්‍රණය කළ පෙළ පොත්වල ඇස්තමේන්තුගත පිටපත් සංඛ්‍යාව පිළිවෙලින් 42,192,500 , 27,598,600 හා 39,714,000 ක් වූ අතර ඒ සඳහා වියදම පිළිවෙලින් රු.මිලියන 10,697 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | වාර්ෂිකව පෙළ පොත් ඇණවුම තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු බොහෝ කරුණු සම්බන්ධයෙන් සලකා බලා ඇති බවක් නිරීක්ෂණය නොවීය. | නිවැරදිව පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කළ යුතු වීම. | පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කිරීමේදී බෙදාහැරීම් ශාඛාව අලෙවි ප්‍රවර්ධන ශාඛාව ලබා දෙන අවශ්‍යතාවයන් මෙන්ම සෑම වර්ෂයකම අවසානයේදී පවත්වන තොග සමීක්ෂණ වාර්තාවල තොරතුරු ද,ජංගම සේවා පැත්වීමේ සමීක්ෂණ වාර්තා ද පොත් ප්‍රදර්ශන සහ වෙළඳ කවුළු පැවැත්වීම් වලදී ලබා ගන්නා දත්තයන් ද පදනම් කරගනු ලබන බව. |
| (ii) | රජයේ පාසල් 10,194 ක සිසුන්ගේ වාර්ෂික පෙළ පොත් අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු ඇණවුම් ලේඛණ මගින් ලබාගෙන එම තොරතුරු සාරාංශ කර වාර්ෂික පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කළ යුතු වුවත් මුද්‍රණය සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන අවස්ථාව වන විටත් අදාල තීරණ ගැනීම සඳහා එම සාරාංශ සකස් කර නොතිබුණි. | නිවැරදිව පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කළ යුතු වීම. | පෙර වර්ෂවලදී පෙළ පොත් අවශ්‍යතාවය පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ දී එම වර්ෂය සඳහා ඇණවුම් ලේඛන මගින් තොරතුරු ගෙන්වා ගැනීම් සිදු කරන නමුත් එම සංඛ්‍යා ලේඛන වල ප්‍රමාදයන් ඇති වූ විට දී පෙර වර්ෂයේ ඇණවුම් ලේඛන වලින් ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යා ලේඛණයට අනුව පෙළ පොත් මුද්‍රණ අවශ්‍යතාවය තීරණය කරනු ලබන බවත් ඉදිරියේදී මෙම සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව ලබා ගැනීම උදෙසා පරිගණක දත්ත මෘදුකාංගයක් සකස් කිරීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතී. |
| (iii) | පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කිරීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛණ අංශය විසින් සකස් කර ඇති එක් එක් පාසලේ එක් එක් විෂයන් හදාරන සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබා ගත් බවට සාක්ෂි නොතිබුණි. 2017 වර්ෂයේදී සමාන්‍ය පෙළ විභාගයට පළමු වරට අයදුම් කල ශිෂ්‍ය සංඛ්‍යාව හා වාර්ෂික පොත් ඇණවුම සැසඳීමේ දී | නිවැරදිව පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කළ යුතු වීම. | ජාත්‍යන්තර පැසල් අවශ්‍යතා , ස්වාභාවික විපත්,ප්‍රදර්ශන වැඩ මුළු සහ අලෙවි ප්‍රවර්ධන යන කරුණු , 2020 වර්ෂය සඳහා පෙළ පොත් අවශ්‍යතා ලේඛනය සකස් කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබේ. අමාත්‍යාංශයෙන් |

| | | |
|---|---|---|
| විෂයයන් 57 කින් විභාගයට අයදුම් කල සිසුන් සංඛ්‍යාව 2,441,503 ක් වූ අතර 10 ශ්‍රේණිය සඳහා ඇණවුම් කරන ලද පොත් සංඛ්‍යාව 3,467,000 ක් විය. ඒ අනුව පොත් 1,025,497 ක් හෙවත් සියයට 42 ක් අවශ්‍යතාවය ඉක්මවා මුද්‍රණය කර තිබුණි | | ලබාගන්නා දත්ත මෙන්ම පාසල්වලින් පෙර වර්ෂයේ ගෙන්වා ගන්නා ලද ඇණවුම් ලේඛන වල ඇතුළත් තොරතුරු ද පදනම් කරන්නා ලද බව. |

(ඉ) **<u>පෙළ පොත් අතිරේක ඇණවුම් මුද්‍රණය කිරීම</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**.**

| | | |
|---|---|---|
| (i) 2017 හා 2018 වර්ෂවල පෙළ පොත් මුද්‍රණය සඳහා මුල් ඇණවුම් අවශ්‍යතාවය නිවැරදිව තීරණය කර නොතිබුණි. ඒ අනුව 2017 වර්ෂයේදී මුල් ඇනවුමෙන් පසු අතිරේක ඇනවුම් තුනක් නිකුත් කර රු.මිලියන 399.59 ක් වටිනා පෙළ පොත් 2,946,700 ක් ද 2018 වර්ෂයේදී මුල් ඇනවුමෙන් පසු අතිරේක ඇනවුම් තුනක් මගින් රු. මිලියන 109.4 ක් වටිනා පෙළ පොත් 1,215,300 ක් ද මුද්‍රණය කර තිබුණි. | මුල් අවස්ථාවේදී නිවැරදිව පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කිරීම තුළින් අතිරේක ඇනවුම් මුද්‍රණය අවම කර ගත යුතු වීම. | 2017 සහ 2018 වර්ෂවල පෙළ පොත් මුද්‍රණය සඳහා අවශ්‍යතාවය තීරණය කර මුල් ඇණවුම ලබා දී තිබුණ ද විවිධ හේතූන් නිසා ලේකම්තුමාගේ අනුමැතිය මත නැවත ඇණවුම් ලබා දීමට සිදු වූ බව. |
| (ii) පෙළපොත් වර්ග 103 ක 2018 වර්ෂයේ ප්‍රසම්පාදන මිල ගණන් 2017 වර්ෂයේ මිලට වඩා සියයට 44 සිට සියයට 257 දක්වා ප්‍රමාණයකින් වැඩි වී තිබුණු අතර පොත් වර්ග 70 ක 2019 වර්ෂයේ ප්‍රසම්පාදන මිල ගණන් 2018 වර්ෂයේ මුද්‍රිත මිලට වඩා සියයට 12 සිට සියයට 58 දක්වා ප්‍රමාණයකින් අඩු වී තිබුණි. 2018 වර්ෂයේ මුද්‍රිත මුළු පිටපත් සංඛ්‍යාව 30,650,300 ක් වූ අතර එම ප්‍රමාණය 2019 වර්ෂයේ මුද්‍රිත පිටපත් ප්‍රමාණයට වඩා පිටපත් 10,279,000 කින් අඩු වීමක් විය. එසේ වුවත් 2018 වර්ෂයේදී පෙළ පොත් මුද්‍රණය සඳහා රු.මිලියන 3,908.22 ක අධික පිරිවැයක් දරා තිබුණු අතර එය 2019 වර්ෂයේ පිරිවැයට වඩා රු.මිලියන 325.65 කින් වැඩි වීමක් විය. පිටපත් සංඛ්‍යාව අඩු වීම පිරිවැය වැඩි වීමට හේතුව ලෙස දෙපාර්තමේන්තුව සඳහන් කළද 2019 වර්ෂයේදී පෙළ පොත්වල පිරිවැය අඩු වී තිබියදීත් 2018 වර්ෂයේ පෙළ පොත් පිරිවැය මෙලෙස ප්‍රමාණාත්මක ලෙස වැඩි | පෙළ පොත් මුද්‍රණය කිරීමේදී රාජ්‍ය මුදල් වඩාත් ඵලදායීව උපයෝජනය කළ යුතුය. | 2017/2018 වර්ෂවලදී ද පොත් මුද්‍රණයේ දී විවෘත ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කරන ලදී.පුවත්පත් දැන්වීම් ප්‍රසිද්ධ කර කැඳවන ලද මිල ගණන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් පත් කරනු ලබන තාක්ෂණ ඇගයීම් කමිටුව මගින් ඇගයීමට ලක්කර ඉදිරිපත් කරන ලදී.එක් එක් වර්ෂය සඳහා මුද්‍රණය කල යුතු පෙළ පොත් ප්‍රමාණයන්ට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඉදිරිපත් වන මිල ගණන් පොතින් පොතට අඩු වැඩිවීම් සිදුවීමත් , පිරිවැය විචලතාවයන්ට හේතුවන සාධකත් මේ සඳහා බලපානු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | වීම මතභේදයට තුඩු දෙන කරුණක් විය. | | |
| (ඊ) | **විෂය නිර්දේශ ප්‍රමාද වී ලැබීම නිසා පෙළ පොත් මුද්‍රණය ප්‍රමාද වීම**<br>2017,2018 සහ 2019 වර්ෂ වලදී සංශෝධනය වූ විෂය නිර්දේශ සාධාරණ කාලයක් තුළ දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණු නිසා නියමිත කාලයට පෙළ පොත් සිසුන් අතට පත් කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. පෙළ පොත් සකස් කිරීම සඳහා සාධාරණ කාල සීමාවකට පෙර විෂය නිර්දේශ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ගෙන්වා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය. | විෂය නිර්දේශ නියමිත කාලයට ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | පෙළපොත් විෂය අන්තර්ගතය සකසා ගැනීම සඳහා විෂය නිර්දේශ , ගුරු අත්පොත් හා අනෙකුත් පිටපත් නියමිත කාලයට ලබා ගැනීමේ අරමුණෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ අදාල නිලධාරීන් සඳහා මේ වනවිට ලිපි මගින් දැනුවත් කිරීම් සිදු කල බව. |
| (උ) | **පෙළ පොත් සැපයුම් කරුවන්ගෙන් දඩ අය කිරීම සහ පිටු අඩු වැඩි වීම් වෙනුවෙන් ගෙවීම් කිරීම**<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| | (i) 2018 පිරිවිතර කමිටු වර්තාවේ 07 ඡේදයට අනුව 6,7,8,9 ශ්‍රේණිවල පෙළ පොත් නැවත භාවිතය සියයට 50 ක් දක්වා වැඩි කිරීම හේතුවෙන් කඩදාසි වල ගුණාත්මකභාවය ඉහළ දැමීමට සහ දීප්තියේ අගය සියයට 85 දක්වා ඉහල දැමීමට තීරණය කර තිබුණද 2017 වර්ෂයේදී 2018 වර්ෂය වෙනුවෙන් මුද්‍රණය කළ මුළු පොත් වර්ග 357 න් 106 ක දීප්තිය වෙනස් වීම හේතුවෙන් රු.මිලියන 6.13 ක දඩ මුදලක් අය කර තිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මුද්‍රණ කරුවන්ට ලකුණු ලබා දීමේදී ගුණාත්මක පොත් ලබා දීමේ පසු ගිය කාර්යසාධනය පිළිබඳ සළකා බලා ලකුණු දීමේ ක්‍රමවේදයක් සොයා බැලිය යුතු වීම. | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් පෙළ පොත් වර්ග 410 ක් පමණ වාර්ෂිකව මුද්‍රණය කර බෙදාහරිනු ලබන අතර 6, 7, 8, 9, ශ්‍රේණිවලට අදාළ පෙළ පොත් නැවත භාවිතයට යොමු කරන බවත් ඒ සඳහා සංකල්පීය අවබෝධයක් ලබා දීමට ද නැවත භාවිත යාන්ත්‍රණය ක්‍රමවත් කිරීමටත් විධිවිධාන සලස්වා ඇති බවත් ගුණාත්මක බවින් වැඩි පොත් ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා බව වාර්තා කර තිබුණි. |
| | (ii) 2018 වර්ෂයට අදාලව සිදු කළ විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ තෝරා ගත් නියදියකට අනුව පිටු වැඩි වීම් 10 සිට 46 දක්වා අතර ප්‍රමාණයක් සඳහා රු.මිලියන | ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මුද්‍රණ කරුවන්ට ලකුණු ලබා දීමේදී ගුණාත්මක පොත් ලබා දීමේ පසු | ඉගෙනීම් ක්‍රියාවලිය සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලියට පූර්ව පෙළ පොත් සැලසුම් අවස්ථාවේ දී ලබා දෙන |

| | | |
|---|---|---|
| 72.86 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණු බවයි. එසේම පිටු අඩු වීම් 10 සිට 32 දක්වා අතර ප්‍රමාණයක් සඳහා රු.මිලියන 39.37ක් අඩුවෙන් ගෙවීම් කර තිබුණි.ඒ අනුව පිටු 10 කට වැඩි ප්‍රමාණයකින් අඩු සහ වැඩිවීම්වලදී පෙළ පොත්වල අන්තර්ගතය වෙනස් වීම මත සිසුන් අපහසුතාවයට පත් විය හැකි බැවින් ගෙවීම් කිරීමේදී ඒ පිළිබඳ සලකා බලා ඇති බවත් නිරීක්ෂණය නොවිය. | ගිය කාර්ය සාධනය පිළිබඳ සළකා බලා ලකුණු දීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගත යුතු බව. | පිටු සංඛ්‍යාව කල්පිත සැලැස්මකි. බහුවරණ ප්‍රශ්න,විවෘත ප්‍රශ්න,ව්‍යුහගත රචනා ප්‍රශ්න, සිතියම් ,චිත්‍ර,රූප සටහන් , වගු , ගණිත නිදර්ශක ,ප්‍රායෝගික අභ්‍යාස , ප්‍රහේලිකා යන අනුශාංගික ප්‍රභවයන්ගේ එකතු කිරීම් / අඩු කිරීම් ප්‍රාමාණික බවෙහි විචල්‍යතා මත පොත රචනා කර නිම කිරීමේදී මුලින් සැලසුම් කළ සංඛ්‍යා දත්ත වෙනස් වන අවස්ථා ප්‍රායෝගිකව සිදු වේ. |

**(උ) <u>අබලි පොත් පත් අපහරණය</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) වාර්ෂික පොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගැනීම නිසා අතිරික්ත පොත් තොග ඉහළ යාම මෙන්ම එම පොත් ගබඩා කිරීමේ දුර්වලතාවයන් හේතුවෙන් 2016,2017 හා 2018 යන වර්ෂයන්හිදී පෙළ පොත්, ගුරු අත් පොත් සහ අතිරේක පොත් 1,190,691 ක ප්‍රමාණයක් අපහරණය කර තිබුණි. | හැකිතාක් නිවැරදිව පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කර පොත් මුද්‍රණය කිරීම හා ගබඩා කිරීම කළ යුතු වීම. | 2016 , 2017 හා 2018 වර්ෂවල අපහරණය කරන ලද පෙළ පොත් පිළිබඳ විශ්ලේෂණයක් ඇමුණුම මඟින් සඳහන් කර ඇත.1999 සිට වර්ෂ ගණනාවක් තිස්සේ විෂය නිර්දේශය වෙනස් වූ පෙළපොත් මෙසේ අපහරණය කර ඇති අතර එම පෙළ පොත් පිළිබඳ විස්තර මෙහි දී ඉදිරිපත් කර ඇත.ඒ ඒ වර්ෂවල විෂය නිර්දේශය වෙනස් වූ 03 ශ්‍රේණිය හා 09 ශ්‍රේණි වල පෙළ පොත් වැඩි ප්‍රමාණයක් මෙසේ අපහරණයට භාජනය කර ඇත. |
| (ii) නිවැරදි දත්ත පදනම් කරගෙන පෙළ පොත් මුද්‍රණය නොකිරීම හේතුවෙන් විෂය නිර්දේශ සංශෝධනය වීමට නියමිත වර්ෂයට පෙර වර්ෂයේදී භාවිතය සඳහා පාසල් විසින් ඉල්ලුම් කළ ප්‍රමාණය ද ඉක්මවා දෙපාර්තමේන්තුව විසින් පෙළ පොත් මුද්‍රණය කිරීම හේතුවෙන් පෙළ පොත් 265,223 ක් පමණ ගබඩා වල ඉතිරි වී තිබුණි. | විෂය නිර්දේශ සංශෝධනය වීමට නියමිත වර්ෂයට පෙර වර්ෂයේ පෙළ පොත් මුද්‍රණය කිරීමේදී වඩාත් සකසුරුවම් ලෙස පොත් මුද්‍රණය කළ යුතුව ඇත. | ඉදිරියේ දී මුද්‍රණය කළ යුතු නිවැරදිම පෙළපොත් ප්‍රමාණය තීරණය කිරීම සඳහා නිවැරදි දත්ත ලබා ගැනීමට දෙපාර්තමේන්තුව සැලසුම් කරගෙන යනු ලබන බව. |

| | | |
|---|---|---|
| (iii) 2018 වර්ෂයේදී පිරිවෙන් විෂය නිර්දේශ සංශෝධනය විම හේතුවෙන් 2017 වර්ෂයට අදාලව මුද්‍රණය කරන ලද රු.මිලියන 4.97 ක් වටිනා පිරිවෙන් පෙළ පොත් 39,366 ක් පිටිපන A ගබඩාවේ වසරකට අධික කාලයක් ගබඩා කර තිබුණි. | විෂය නිර්දේශ සංශෝධනය වීමට නියමිත වර්ෂයට පෙර වර්ෂයේ පෙළ පොත් මුද්‍රණය කිරීමේදී වඩාත් සකසුරුවම් ලෙස පොත් මුද්‍රණය කළ යුතු වීම. | මුද්‍රණය කළ පොත් ප්‍රමාණය මුල් ඉල්ලුමට වඩා පසුව වෙනස් වු බැවින් පොත් තොගයක් ඉතිරි වු බව. |
| (iv) පිටිපන B නඩුහේන පොත් ගබඩා වල 2018 දෙසැම්බර් 15 දින වන විට පැවති රු.මිලියන 205.29 ක් වටිනා අතිරේක පොත් 1,545,883 ක ප්‍රමාණයක් ප්‍රථම ලැබීම් හා ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය (FIFO) අනුව ගබඩා කර නොතිබිම හේතුවෙන් පොත් අපතයන් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | පොත් විධිමත්ව ගබඩා කිරීමට පියවර ගත යුතු වීම. | මේ පිළිබඳ කටයුතු කිරීම සඳහා වාර්තාවක් ලබා ගැනීමට 2019 මැයි 15 දින කමිටුවක් පත්කළ අතර එම වාර්තාව ලද පසු අධ්‍යාපන ලේකම්ගේ වැඩිදුර උපදෙස් සඳහා යොමු කිරීමට කටයුතු සැලසුම් කරන බව සහ ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇති බව. |
| (v) 2018 දෙසැම්බර් 15 දිනට පිටිපන හා නඩුහේන ගබඩාවල රු.මිලියන 217.31 ක් වටිනා සෙමින් චලනය වන අතිරේක පොත් 1,105,418 ක ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය වු අතර එම පොත් ගබඩා කිරීමේ දුර්වලතා හා දිර්ඝ කාලයක් ගබඩාවේ අසුරා තිබිම වැනි කරුණු හේතුවෙන් පොත් වැඩි ප්‍රමාණයක් භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වී තිබුණි. | පොත් විධිමත්ව ගබඩා කිරීමට පියවර ගත යුතු වීම. | මේ පිළිබඳ කටයුතු කිරීම සඳහා වාර්තාවක් ලබා ගැනීමට 2019 මැයි 15 දින කමිටුවක් පත්කළ අතර එම වාර්තාව ලද පසු අධ්‍යාපන ලේකම්ගේ වැඩිදුර උපදෙස් සඳහා යොමු කිරීමට කටයුතු සැලසුම් කරන බව සහ ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇති බව. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් දැනුවත් වී තිබුණු නමුත් , එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීමේ වැඩ පිළිවෙල සැලසුම්වලට ඇතුළත් කර එම ඉලක්ක කරා ළඟ විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කරන බව. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ සේවාවන් කාර්යක්ෂමව ඉටු කිරීමටත් අභ්‍යන්තර පාලනය ශක්තිමත් වීමටත් දෙපාර්තමේන්තුවේ ශාඛා අතර අභ්‍යන්තර ස්ථාන මාරුවීම් වසර 5 කට වරක්වත් සිදුකල යුතු වුවද එකම ශාඛාවක් තුල වසර 5 ත් 19 ත් අතර කාලයක් සේවය කරන නිලධාරින් 31ක් විය. | විධිමත් අභ්‍යන්තර ස්ථාන මාරු වීම් ක්‍රම වේදයක් සකස් කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයන් හි සේවය කරන නිලධාරීන්ගේ රාජකාරි විෂය ප්‍රධානීන් වශයෙන් විවිධාකාර වේ. එම නිලධාරීන් විෂය සුවිශේෂිත්වය මත බඳවාගෙන නිෂ්පාදනයේ දී විවිධ කාර්යභාරයන්ට ස්ථානගත වීම් සිදුකර පෙළපොත් නිෂ්පාදනයේ දී විවිධ කාර්යභාරයන්ට යොදවා ගනු ලැබේ. |
| (ආ) | මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු 02 ක් අනුමත කාර්ය මණ්ඩලය තුල තිබුණද ඒ සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීමට පියවර ගත යුතු වීම. | මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා ද බඳවා ගැනීම් පටිපාටිය සකස් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මූලික කටයුතු සාකච්ඡා කරන ලදී.ඉදිරි විධිවිධාන සැලැස්වීමට හා ක්‍රියාමාර්ග ගනු ලැබීමට අවශ්‍ය සැලසුම් සකස් කරනු ලැබේ. |